සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

47 S

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : .................... සිංහල සාහිත්‍ය රසාස්වාදය කාලය : පැය 03 යි.

I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. **(i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති අ, ආ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

(i) ''එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි ඇදුරුකමට නිස්සෝ ය.''
   (අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (ආ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් පිළිබඳව ද? ලකුණු 2 × 2 = 4යි

(ii) ඉතා තදපරුෂ ගත් හැඟි වූ මැගෙන් මට ප්‍රයෝජන කිම්ද?
   (අ) මෙහි ප්‍රයෝජනයක් නැතැයි ප්‍රකාශ කළේ කාගෙන් ද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටාගත් ග්‍රන්ථය රචනා කළ යුගය කුමක් ද? ලකුණු 2 × 2 = 4යි

(iii) ''ඈ තමා හිඳ ගත් තැනින් පැන අවුත් මට පහරක් ගැසුවාය.''
   (අ) මෙය සිදුවූයේ කුමන අවස්ථාවේ දී ද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටාගත් ග්‍රන්ථය කුමක් ද? එය රචනා කළේ කවුරුන් ද?
   ලකුණු 2 × 2 = 4යි

(iv) කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
   දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු
   ............................................................ ........................
   ............................................................ ........................
   (අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම කවිය උපුටාගත් කවි පන්තිය රචනා කළ රචකයා කවුරුන් ද? ලකුණු 2 × 2 = 4යි

(v) නපුරු කලට සත හට පැමිණෙන වෙහෙස
   එදුරු නො වෙයි කළ පව් පල දෙවා මිස
   තඹුරු වනය මුකුලිත වන බව සවස
   කවුරු විසින් වැළකිය හැකි මෙ දිය කුස
   (අ) මෙම කවිය කුමන කාව්‍ය ප්‍රභේදයට අයත් වූවක් ද?
   (ආ) ඉහත කවියෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 2 × 2 = 4යි

මුළු ලකුණු 4 × 5 = 20යි

02. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

ගෙන එයි මිහිරි ගී මදනල හමන විට
වැටහෙයි නොවැටුහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිටගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගනිම් කිව ද මිනිසා සතු දෙ නෙත තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන්ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කුළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

(i) මෙම පැදි පෙළට පාදක වී ඇති තේමාව පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(ii) කවියා යොදාගෙන ඇති ආකෘතිය එම අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා උචිත වන්නේ කෙසේ ද? (ලකුණු 05යි)

(iii) මෙම පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයක් බවට ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 05යි)

(iv) ''ඩහදිය හෙළන අය' පිළිබඳ කවියාගේ ආකල්පය කුමක් ද? (ලකුණු 05යි)

(v) කවියා යොදාගත් භාෂාව රස නිෂ්පත්තිය උදෙසා කෙතෙක් දුරට ගැළපේ ද? (ලකුණු 05යි)

මුළු ලකුණු 5 × 5 = 25යි)

## II කොටස

එකල ඔවුන්ට මේ රන්රුව මද්‍ර රජ්ජුරුවන්ගේ දියණියන් ප්‍රභාවතීන්ගේ රූපශ්‍රීන් සොළොස්වන කලාවෙන් කලාවකුත් නොහඟනේ යයි කුද කිව. ඔහු එබස් අසා සතුටුව රජගෙයි වාසලට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගෙන් ආ දූතයෝ වාසල සිටියාහු'යි මද්‍ර රජ්ජුරුවන්ට කියා යවූහ. එබස් අසා මද්‍ර රජ්ජුරුවෝ උනස්නෙන් නැඟීසිට ''ගෙනව ගෙනව''යි වහා ගෙන්වාගෙන දුටහ. එකල දූතයෝ ''දේවයන් වහන්ස අපගේ රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ සුවදුක් විචාළ සේක'' යනාදීන් කථාකොට කරන ලද සම්භාවනා ඇතිව රජ්ජුරුවන් විසින් කුමක් පිණිස අවුදූ''යි විචාළ කල්හි ''අපගේ රජ්ජුරුවන් වහන්සේගේ සිංහ ගර්ජනාවට බඳු වූ අභීත නාද ඇති කුස නම් කුමාරයෙක් ඇත. අපගේ රජ්ජුරුවන් වහන්සේ උන් වහන්සේට රාජ්‍යය දෙනු කැමති සේක්. නුඹ වහන්සේ සමීපයට එවූ සේක නුඹවහන්සේගේ ප්‍රභාවතී නම් කුමාරිකාවන් වහන්සේ මේ රන්රුව වියදමට ඇරගෙන දෙවා වදාළ මැනැවැ''යි කිවු ය.

(i) මෙම ඡේදයේ සඳහන් කර ඇති කලාවන් ගණන කීයද? (ලකුණු 05යි)

(ii) මෙහි සඳහන් ආකාරයට දූතයන් එවා ඇත්තේ කුමන රජ්ජුරුවන් ද? (ලකුණු 05යි)

(iii) දූත පිරිස මද්‍ර රජ්ජුරුවන් මුණ ගැසීමට පැමිණි හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) මෙම ඡේදයේ ඇතුළත් භාෂා ලක්‍ෂණ උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 10යි)

(මුළු ලකුණු 25යි)

නැතහොත්

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ.

නම්බුව කැමති අය ඇති නම් නොවී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ටම එකතු වෙලා
ලොම් සිදුරක තරම්වත් අඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

වඳින්නේ නැතිව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවනත කර ගෙන වහම
අපේ නමට සලකා දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

(i) අඬ දබර නොවී සිටින්නට යැයි කවියා පවසන්නේ කුමන අයුරින් ද? (ල. 05යි.)

(ii) ගමට ආදරයක් ඇත්නම් කෙසේ සිටිය යුතුදැයි කවියා ප්‍රකාශකර ඇත් ද? (ල. 05යි.)

(iii) නිලධාරීන් පිළිබඳ කවියාගේ ආකල්පය පැහැදිලි කරන්න. (ල. 05යි.)

(iv) මෙම පද්‍ය පන්තියේ ඇතුළත් කාව්‍යාලංකාර 3ක් උදාහරණ සහිතව දක්වන්න. (ල. 10යි.)

## II කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (පිළිතුර වචන 150ට නො අඩු විය යුතුයි)

04. සියලු අභියෝග ජයගනිමින් කුස කුමරු තම අරමුණ ඉටුකරගත් ආකාරය නිදසුන් තුනක් සහිතව පැහැදිලි කරන්න.

නිදසුන් 3 සඳහා ලකුණු 03යි, විස්තර සඳහා ලකුණු 12යි
මුළු ලකුණු 15යී.

05. අවස්ථා හා සිද්ධි මැනවින් නිරූපණය කිරීම වෙසක් පහන කෙටි කතාවේ සාර්ථකත්වය කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න.

නිදසුන් 3 සඳහා ලකුණු 03යි, විස්තර සඳහා ලකුණු 12යි
මුළු ලකුණු 15යි.

06. සුභාෂිත කතුවරයා සමාජ සාරධර්ම විවරණය කිරීම සඳහා ස්වාභාවික පරිසරයත් එහි සිද්ධීනුත් යොදාගෙන ඇති ආකාරය උදාහරණ තුනක්වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

නිදසුන් 3 සඳහා ලකුණු 03යි, විස්තර සඳහා ලකුණු 12යි
මුළු ලකුණු 15යි.

07. වෙසක් පහන කෙටි කතාවේ අන්තර්ගත කෙටිකතා ලක්ෂණ තුනක් උදාහරණ ඇසුරෙන් විමසන්න.

නිදසුන් 3 සඳහා ලකුණු 03යි, විස්තර සඳහා ලකුණු 12යි
මුළු ලකුණු 15යි.